www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වර්ධනය වන එක්සත් ජනපද-චීන සතුරුකම්වලින් මතු වන අන්තරායයෝ

## The dangers of mounting US-China rivalry

2010 අගෝස්තු 12

පසු ගිය මාසය තුල දී ඔබාමා පාලනාධිකාරය චීනයට එරෙහි සිය ආක්‍රමනශීලී ස්ථාවරය යලි අලුත් කර ද වැඩි දියුනු කර ද ඇත. ඉරානයට එරෙහිව නව සම්බාධක වටයක් පැනවීමේ එක්සත් ජනපද පියවරයන්ට බෙයිජිං පාලනයේ සහාය ලබා ගැනීමට වොෂින්ටනය උත්සාහ කල මැයි සහ ජූනි මාසවල දී ඇති වුනු කෙටි විරාමයකින් පසුව නැගෙනහිර සහ ගිනිකොනදිග ආසියාවෙහි සිදු කල ආක්‍රමනශීලී ක්‍රියාවන් මාලාවක් හරහා එක්සත් ජනපදය චීනය සමග පවතින ආතතිවලට හිතාමතා යලි ගිනි අවුලා ඇත.

ජූලි 23 වන දා පැවැත්වුනු ගිනිකොනදිග ආසියාතික රටවල සංවිධානයේ (ආසියාන් සංවිධානයේ) ආරක්ෂක සංසදයේ දී කතා කල එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් වියට්නාමයට සහ අනෙකුත් ආසියාන් රටවලට දකුනු චීන මුහුද සම්බන්ධයෙන් චීනය සමග පවතින මතභේදවලට අදාලව ප්‍රකෝපකාරී ලෙස චීනයට එරෙහිව එම රටවල පැත්ත ගත්තා ය. දකුනු චීන මුහුද තමන්ගේ එක් "කේන්ද්‍රීය උත්සුකතාවක්" හැටියට සලකන බව බෙයිජිං පාලනය මාර්තුවේ දී ජ්‍යෙෂ්ඨ ඇමරිකානු නිලධරයන් දෙදෙනෙකුට දන්වා සිටියේ ය. එහෙත් එම පනිවුඩය නො සලකා හැරි ක්ලින්ටන් චීනය උරුමකම් කියන මුහුදු ප්‍රදේශයට "නිදහසේ ප්‍රවේශ වීමේ ඉඩකඩ" සලසා දීමට වහා පියවර ගත යුතු යැයි ඉල්ලා සිටියා ය. චීනයේ විදේශ ඇමති යැං ජිෂි මෙම ක්‍රියාව විස්තර කලේ "චීනයට සැබවින් ම එල්ල කල ප්‍රහාරයක්" ලෙස ය.

දින කිහිපයකට පසුව එක්සත් ජනපදය චීන විරුද්ධතාවන් නො තකා දකුනු කොරියාව සමග එක්ව ජපාන මුහුදෙහි වඩා බලගතු නාවික අභ්‍යාසයක් ආරම්භ කලේ ය. මාර්තුවේ දී උතුරු කොරියාව දකුනු කොරියානු නාවික හමුදා යාත්‍රාවක් මුහුදුබත් කලේ ය යන්නට දැක්වුනු නාම මාත්‍ර ප්‍රතිචාරයක් වූ මෙම යුද අභ්‍යාසවලට යූඑස්එස් ජෝර්ජ් වොෂින්ටන් නමැති සද්දන්ත ගුවන් යානා ප්‍රවාහක නෞකාව ඇතුලු දකුනු කොරියානු සහ ඇමරිකානු යුද නැව් 20ක් සම්බන්ධ විය. මේ වසර අග දී චීන මහා භූමි ප්‍රදේශයට වඩා සමීප කහ මුහුදේ දී දකුනු කොරියාව සමග තවත් නාවික හමුදා අභ්‍යාස පවත්වන බව පෙන්ටගනය දැන් නිවේදනය කර ඇත.

හැනෝයි පාලනයට එක්සත් ජනපද න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරක තාක්ෂනය විකිනීම සඳහා වියට්නාමය සමග සාකච්ඡා කරමින් තිබෙන න්‍යෂ්ටික ගිවිසුමක විස්තර ඔබාමා පාලනාධිකාරය පසු ගිය සතියේ එලිදරව් කලේ ය. දකුනු චීන මුහුද සම්බන්ධ මතභේදයේ දී ඒ වන විටත් වියට්නාම් තන්ත්‍රයට සහාය දී තිබුනු තතු යටතේ මෙම න්‍යෂ්ටික ගනුදෙනුව චීනයට එරෙහිව එක්සත් ජනපදය සහ වියට්නාමය අතර සිදු වන්නට යන වඩා සමීප මූලෝපායාත්මක පෙල ගැසීමක් පිලිබඳ තවත් සංඥාවක් විය. අපේක්ෂා කල පරිදි ම මෙම පියවර බීජිං පාලනය කෝප ගැන්වී ය. "පවත්නා ජාත්‍යන්තර පටිපාටියට අභියෝග කරන" "දෙබිඩි පිලිවෙත" පිලිබඳව එය වොෂින්ටනයට චෝදනා කලේ ය.

මෙම ආතතීන් පසුපස පවතින්නේ බලවේග අතර ගෝලීය සමතුලිතතාවෙහි සිදු වී තිබෙන ප්‍රගාඪ වෙනස් වීම් ය. මෙම වසරේ දී එක්සත් ජනපදයට පසුපසින් සහ ජපානයට ඉදිරියෙන් ලෝකයේ දෙවන විශාලතම ආර්ථිකය බවට පත්ව ඇති චීනය පසු ගිය දශක දෙක තිස්සේ අත් කර ගත් වේගවත් ආර්ථික නැගීම ආසියාව තුලත් ලොව පුරාත් සම්බන්ධතා කඩා බිඳ දමමින් පවතී. එක්සත් ජනපදය තමන්ගේ ඓතිහාසික ආර්ථික පරිහානියට ප්‍රතිචාර දක්වා ඇත්තේ බලශක්ති සම්පත්වලින් පොහොසත් මධ්‍යම ආසියානු සහ මැද පෙරදිග කලාප තුල ආධිපත්‍යය අත් කර ගැනීමට ද ජපානයේ සහ දකුනු කොරියාවේ සහ මුලු ගිනිකොනදිග ආසියාව හරහා ඉන්දියාව, පකිස්ථානය සහ ඇෆ්ඝනිස්ථානය දක්වා රටවල් සමග සන්ධානයන් සහ හවුල්කාරිත්වයන් ඇති කර ගනිමින් චීනයට එරෙහි වීමට ද උත්සාහ කිරීමෙනි.

2007-08 දී පුපුරා ගිය ගෝලීය ආර්ථික අර්බුදය බලවතුන් දෙදෙනා අතර තරගකාරිත්වයන් බෙහෙවින් නරක අතට හරවා ඇත. ශීඝ්‍ර මූල්‍යමය බිඳ වැටීමක අන්තරායට මුහුන දුන් ඔබාමා පාලනාධිකාරය මුල දී බෙයිජිං පාලනයේ සහාය ලබා ගැනීමට උත්සාහ කලේ

ය. ලෝකයේ විශාලතම නයගැතියා වන එක්සත් ජනපදය චීනයෙන් ගලා එන අරමුදල් මත බෙහෙවින් පදනම් වී සිටී. එහෙත් මූල්‍යමය කලබැගෑනිය තාවකාලිකව ලිහිල් වෙද්දී වොෂින්ටනය චීන ව්‍යවහාර මුදල යලි ඇගයීම, වෙලඳ සහ පාරිසරික වෙනස් වීම් පිලිබඳ මූල පිරීම් ඇතුලු කාරනා ගනනාවක් මත බෙයිජිං පාලනයට පීඩනය යෙදීමට පටන් ගත්තේ ය. එමෙන් ම එය ආසියා පැසිෆික් කලාපය තුල ක්‍රියාකාරීව මැදිහත් වීමට ද පටන් ගත්තේ ය.

පසු ගිය ජුලි මාසයේ දී එක්සත් ජනපද රාජ්‍ය ලේකම් ක්ලින්ටන් තායිලන්තයෙහි පැවැත්වුනු ආසියාන් සමුලුවක් හමුවේ නො වලහා කියා සිටියේ එක්සත් ජනපදය "ආසියාව කරා ආපසු පැමින ඇති" බව යි. මෙය වූ කලි ආසියාව නො තකා හැරීම සම්බන්ධයෙන් කලින් පැවති බුෂ් පාලනාධිකාරයට එල්ල වුනු විවේචන පිලිබඳව කල සැඳහුමක් විය. "චීනයේ අසල්වැසියන් බොහෝ දෙනෙකු ‍‍ඍඑහි නැගීම පිලිබඳව‍ ඎ උත්සුකතා පල කර ඇති බව මා දන්නවා, ඉතිං අප නැගෙනහිර සහ ගිනිකොනදිග ආසියාව තුල පිහිටා තිබෙන බොහෝ රටවල් එක්ක අපගේ සම්බන්ධතා ශක්තිමත් කර ගත යුතු යි," වාර්තාකරුවන් හමුවේ කියමින් ක්ලින්ටන් අලුත් රාජ්‍ය තාන්ත්‍රික ප්‍රහාරයක සංඥා නිකුත් කලා ය.

"ආසියාව තුල දී එක්සත් ජනපද බලයට එල්ල වන චීනයේ අභියෝගය" මැයෙන් චිකාගෝ විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා මහාචාර්ය ජෝන් මර්ෂීමර් අගෝස්තු 4 වන දා සිඩ්නිහි දී පැවැත්වූ දේශනයකින් වැඩෙන එක්සත් ජනපද-චීන ඝර්ෂනවල අන්තරායකාරී ඇඟවුම් තරමක් දුරට පැහැදිලි විය. සිඩ්නි විශ්ව විද්‍යාලයෙහි ජාත්‍යන්තර ආරක්ෂක අධ්‍යයන මධ්‍යස්ථානයේ ආරාධනාවෙන් ඕස්ට්‍රේලියාවට ගිය නිපුන, ඉදිරිදර්ශනාත්මක විදේශ පිලිවෙත් විශ්ලේෂකයෙකු වන මර්ෂීමර් ආසියාව තුල සහ ලෝකය තුල මත් සාමය සඳහා පවතින අපේක්ෂා පිලිබඳ අම්හිරි චිත්‍රයක් සිතුවම් කලේ ය. සිසුන්ගෙන්, විදේශ ප්‍රතිපත්ති සම්පාදක නිලධරයන් සහ රාජ්‍ය තාන්ත්‍රිකයන්ගෙන් පිරී ගිය ප්‍රේක්ෂකයක් හමුවේ ඔහු කියා සිටියේ චීනයේ අතිමහත් ආර්ථික ප්‍රසාරනයේ ප්‍රතිඵලයක් ලෙස බටහිර අර්ධ ගෝලයෙහි—උතුරු, මධ්‍යම සහ දකුනු ඇමරිකාවෙහි—ප්‍රමුඛත්වයට පත් වීම සඳහා එක්සත් ජනපදය යොදා ගත් කෲර විධික්‍රමයන් ම යොදා ගනිමින් කලාපීය බලවතෙකු පත් වීමට ද තම සතුරන් බවට පත් විය හැකි රටවල් බැහැර කර තැබීමට ද චීනය උත්සාහ කරනු ඇති බව යි.

"චීනය සහ එක්සත් ජනපදයත් යුද්ධය සඳහා පවතින සැලකිය යුතු ඉඩකඩත් සමග ආරක්ෂාව පිලිබඳ තීව්‍ර තරගකාරිත්වයක් ඇති විය හැකි තත්ත්වයක් පවතින නිසා ඕස්ට්‍රේලියානුවන් චීනයේ නැගීම පිලිබඳව කනස්සල්ලට පත් විය යුතු යි," මර්ෂීමර් කියා සිටියේ ය. "එමෙන් ම, ඉන්දියාව, ජපානය, සිංගප්පූරුව, දකුනු කොරියාව, රුසියාව, වියට්නාමය, ඇත්තට ම ඕස්ට්‍රේලියාවත් ඇතුලු චීනයේ බොහෝ අසල්වැසියන් චීනයේ බලය මැඩ පැවැත්වීමට එක්සත් ජනපදයත් එක්ක එකතු වේවි. කෙලින් ම කියනව නං: චීනයට සාමකාමීව නැගී සිටින්න බැහැ."

සාමාකාමී මැදිහත් වීම්වලටත් යහපත් දෙය ජය ගනු ඇති බවට කරන ප්‍රකාශවලටත් ගැටුම වැලැක්වීම සම්බන්ධයෙන් මොන යම් හෝ කාර්ය භාරයක් ඉටු කල හැකි ය යන අදහස මර්ෂීමර් බැහැර කලේ ය. ආරක්ෂක මිලිටරිමය වර්ධනයක් ලෙස එක් රටක් සැලකිය හැකි දෙය ආක්‍රමනයක් ඇති වීමට තිබෙන අන්තරායකාරී ඉඩකඩක් ලෙස එහි සතුරන් විසින් දකිනු ලැබීම නො වැලැක්විය හැකි ය. චීන නායකත්වයේ ස්ථාවරයෙන් ගත් විට සිය ගෝලීය අවශ්‍යතාවන් ආරක්ෂා කර ගැනීමට රටේ මිලිටරිමය බලවේග පුලුල් කිරීම මුලුමනින් ම තාර්කික බව ඔහු පැහැදිලි කලේ ය. මැත අත්දැකීම් පදනම් කර ගනිමින් මර්ෂීමර් මෙසේ කියා සිටියේ ය: චීන නායකයන් " එරට ‍‍ඍඑක්සත් ජනපදය‍ඎ යුදකාමී සහ අන්තරායකාරී රටක් ය යන නිගමනයට එලඹෙන්න බෙහෙවින් ම ඉඩ තියෙනවා. සත්තකින් ම, සීතල යුද්ධයෙන් පස්සෙ ගෙවුනු අවුරුදු 21න් 14ක් ම ඇමරිකාව ගත කරල තියෙන්නෙ යුද්ධ කරමින්. ඒ කියන්නෙ හැම අවුරුදු 3කින් ම 2ක්. පැහැදිලිව ම ඔබාමා පාලනාධිකාරය ඉරානයට එරෙහිව අලුත් යුද්ධයක් ගැන කල්පනා කරමින් ඉන්න බවත් සිහි තබා ගන්න."

ලෝකයේ විශාලතම ලාභ ශ්‍රම වේදිකාව ලෙස ආර්ථික වශයෙන් නැගී ඒමත් සමග පෘථිවි ගෝලයේ සෑම අස්සක් මුල්ලකින් ම රටට කෙරෙන අමුද්‍රව්‍ය ආනයනය අතිමහත් ලෙස පුලුල් කර ගැනීමේ අවශ්‍යතාවක් චීනය හමුවේ මතු වී ඇත. ඊට අතිශයින් වැදගත් තෙල් සහ ගෑස්වලින් අඩකටත් වඩා ආනයනය කෙරෙන්නේ ප්‍රධාන වශයෙන් ම මැද පෙරදිගින් සහ අප්‍රිකාවෙනි. මෙම හේතුව නිසා ගුවන්-නාවික හමුදාවක් ගොඩ නැගීමෙන් දකුනු චීන මුහුද හරහා ඉන්දියන් සාගරය ඔස්සේ වැටී ඇති සිය මුහුදු මාර්ග සුරක්ෂිත කර ගැනීමට චීනය අධිෂ්ඨාන සහගතව සිටී. මෙය වැලැක්වීම සඳහාත් තමන්ගේ නාවික හමුදා ආධිපත්‍යය දිගට ම පවත්වා ගෙන යාම සඳහාත් එක්සත් ජනපදය ද ඒ අයුරින් ම අධිෂ්ඨාන සහගතව සිටී.

චීනයට ඛනිජ ද්‍රව්‍ය අපනයනය කරන ප්‍රධාන අපනයනකරුවෙකු ලෙස තමන්ට පවතින ආර්ථික අවශ්‍යතාවන් ද තමන් දිගු කලක් තිස්සේ එක්සත් ජනපදය සමග පවත්වා ගෙන යන මිලිටරිමය සන්ධානය ද අතර තුලනය වීමට මේ තාක් උත්සාහ දරා ඇති ඕස්ට්‍රේලියාව නො වැලැක්විය හැකි ලෙස ම

එක්සත් ජනපද-චීන ගැටුම තුලට ඇද දැමෙනු ඇතැයි මර්ෂීමර් පැහැදිලි කලේ ය. ඉන්දියානු සාගරයෙන් දකුනු චීන මුහුදට පිවිසීම සඳහා චීන නැව්වලට පවතින්නේ විකල්ප තුනක් පමනකැයි ඔහු පැවසී යඃ එනම්, ඇමරිකාවේ සමීප මිතුරෙකු වන සිංගප්පූරුවේ ප්‍රබල පාලනය යටතේ පවතින මලක්කා සමුද්‍ර සන්ධිය හෝ ඉන්දුනීසියානු දූපත් සමූහය හරහා වැටී ඇති ඕස්ට්‍රේලියාවේ උතුරට ඉතා ම ආසන්නව පිහිටා ඇති ලොම්බොක් සහ සුන්ඩා සමුද්‍ර සන්ධි දෙක යි. "සිය මුහුදු මාර්ගයෙහි ඕස්ට්‍රේලියාව පෙනී සිටින්නට ඉඩ තිබීමේ තර්ජනය බල රහිත කිරීමට චීනය ගන්නා පියවරයන් ... නිසැක ලෙස ම චීනය මැඩ පැවැත්වීම සඳහා වොෂින්ටනය සමග සමීපව වැඩ කිරීමට කැන්බරාව තල්ලු කරනු ඇත."

තමන්ට තම නිගමන පෙනෙන්නේ "අවංක අපේක්ෂා භංග" ඒවා ලෙස බව මර්ෂීමර් නො වලහා පිලිගත්තේ ය. එමෙන් ම, ඔහු කතා කරමින් සිටියේ චීනයේ නැගීම නිසා මීන් දශක දෙකකට ඉදිරියේ දී සිදු වියහැකි බලපෑම ගැන වුවත් ක්ෂනික ප්‍රතිවිපාක ද පවතී. සතුරන්ට එරෙහිව තම අවශ්‍යතාවන් අඛන්ඩව පවත්වා ගෙන යාම සඳහා ආක්‍රමනකාරී මිලිටරි ක්‍රියාවන් දියත් කිරීමට තමන්ට පවතින අධිෂ්ඨානය—විශේෂයෙන් ම ඉරාකය සහ ඇෆ්ඝනිස්ථානය තුල දී—එක්සත් ජනපදය දැනට මත් පෙන්නුම් කර ඇත. පෙන්ටගනය තම සමස්ත මූලෝපායාත්මක දෘෂ්ටිය ම පදනම් කර ඇත්තේ මිතුරෙකු හෝ සතුරෙකු වේවා එක්සත් ජනපද මිලිටරි ආධිපත්‍යයට අභියෝග කිරීමට සමත් මොන යම් බලවතෙකු හෝ මතු වීම වැලැක්වීම මත ය. ඔබාමා පාලනාධිකාරය ආසියාව තුල ක්‍රියාත්මක කල මෑත ම පියවරයන් චීනයේ කලාපීය බලපෑමට එරෙහිව ක්‍රියා කර සහ චීනයේ මිලිටරි ප්‍රසාරනයට බලගතු බාධාවන් නිර්මානය කර චීනයේ නැගීම පූර්වභංග කිරීම ම ඉලක්ක කර ගත් මූලෝපායක කොටසකි.

එක්සත් ජනපද-චීන ගැටුමට අර්ථභාරී ඓතිහාසික සමාන්තරයෝ පවතිත්. විසි වන සියවස ආරම්භයේ දී වේගවත් සහ ක්‍රියාශීලී ධනපති බලවතෙකු ලෙස ජර්මනියේ මතු වීම අධිරාජ්‍ය බ්‍රිතාන්‍යයත් අනෙකුත් ප්‍රධාන බලවතුනුත් සමග විනාශකාරී ලෝක යුද්ධ දෙකක් ඇති කල ගැඹුරු වන තරගකාරිත්වයක් සහ සතුරුකමක් අවුලා ලී ය. 1930 ගනන්වල දී සහ 40 ගනන්වල දී ජපානයේ නැගීමත් වෙලඳ පොලවල් සහ අමුද්‍රව්‍ය සඳහා වූ එහි අවශ්‍යතාවත් එය එක්සත් ජනපදය සහ ආසියාව තුල පුපුල් වෙමින් පැවති එක්සත් ජනපද අවශ්‍යතා සමග ඝට්ටනයකට ඇද දැමී ය. 1941 දී දෙවන ලෝක යුද්ධය පැසිෆික් කලාපය කරා ව්‍යාප්ත වීමට මුල පිරුනේ ජපානය දනින් වැට්ටීමට තර්ජනය කරමින් එක්සත් ජනපදය තෙල් සම්බාධක පැනවූ විට ය යන්න අර්ථභාරී කරුනකි. බෙයිජිං පාලනය හොඳින් ම දන්නා පරිදි වත්මන් සහ ඇති විය හැකි සතුරන්ට බලශක්ති සැපයුම් අවහිර කිරීම සඳහා තමන්ට පවතින හැකියාව අඛන්ඩව පවත්වා ගෙන යාමට දෙවන ලෝක යුද්ධය අවසන් වුනු තැන් පටන් ඇමරිකානු මිලිටරිය උත්සාහ දරා ඇත.

ගෝලීය ධනවාදය 1930 ගනන්වලින් මෙපිට දී හට ගත් නරක ම ආර්ථික අර්බුදය තුල ගිලී යමින් සිටිය දී මේ වතාවේ දී න්‍යෂ්ටික අවිවලින් සන්නද්ධ රටවල් ද සම්බන්ධ කර ගනිමින් යලි වතාවක් ව්‍යසනකාරී ගෝලීය යුද බියක තර්ජනය මතු කරමින් වෙලඳ පොලවල්, අමුද්‍රව්‍ය සහ මූලෝපායාත්මක ස්ථාන අරබයා බලගතු බල තරගයක් පැන නැගීමේ අන්තරායක් පෙනෙන්නට ඇත. ලාභ ක්‍රමය සහ සතුරු රාජ්‍යයන්ට ලෝකය බෙදා ලූ එහි යල් පැන ගිය බෙදීම අහෝසි කරමින් සහ ප්‍රජාතන්ත්‍රවාදීව සංවිධිත සහ තාර්කිකව සැලසුම්ගත ලෝක ආර්ථිකයකින් එය විස්ථාපනය කරමින් ඒකාබද්ධව සහ ගෝලීය පරිමානයකින් බලමුලු ගැන්වෙමින් එවන් යුද්ධයක් වැලැක්වීමේ ශක්‍යතාව සහිත එක ම සමාජ බලවේගය වන්නේ ජාත්‍යන්තර කම්කරු පන්තිය යි. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සහ ලෝකය පුරා පවතින එහි ශාඛාවන් ඉදිරිපත් කරන සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී ඉදිරි දර්ශනය එය යි.

පීටර් සිමන්ඩ්ස්

© www.wsws.org